| 06-01-2026 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, බ්‍රහ්ම බාබා, ශිව් බාබාගේ රථයයි, තවද දෙදෙනාගේම චරිත කොටස් පවතින්නේ එකටයි. මේ පිළිබඳව බීඳකුදු සැකයක් නොතිබිය යුතුයි.

**ප්‍රශ්නය:** දුකෙන් මිදීම සඳහා මිනිසුන් නිර්මාණය කර ඇති, කුමන ක්‍රමයද විශාලතම පාපය ලෙස හැඳින්වෙන්නේ?

**පිළිතුර:** මිනිසුන් දුකට පත්වුණු විට, තම දිවි නසා ගැනීම සඳහා ඔවුන් විවිධ ක්‍රම සොයති. ඔවුන් දිවි නසා ගැනීමට සිතන්නේ එය කිරීමෙන් තමාට දුකින් මිදීමට හැකි බව ඔවුන් විශ්වාස කරන නිසයි. කෙසේවෙතත්, ඊට වඩා විශාල පාපයක් නොමැත. ඔවුන් ඊටත් වඩා දුකෙහි සිරවෙයි, මන්ද, මෙය අසීමිත දුක ඇති ලෝකය බැවින්ය.

ඕම් ශාන්ති. පරමාත්ම පියා ඔය දරුවන් ගෙන් අසයි; උත්තරීතර ජීවය ඔය ජීවයන්ගෙන් විමසයි : ඔබ උත්තරීතර පියා, උත්තරීතර ජීවය ඉදිරියේ අසුන් ගෙන සිටින බව ඔබ දන්නවාද? ඔහුට තමාගේම රථයක් නොමැත. පියා, මෙම නළල මැද වෙසෙනවා යන විශ්වාසය ඔබට තිබේ, එසේ නොවේද? මෙම කෙනාගේ නළල මැද, තමන් අසුන් ගෙන සිටින බවත්, ඔහුගේ ශරීරය ණයට ගන්නා බවත් පරම පියාම පවසයි. ජීවය ඇත්තේ නළල මැදයි, ඉතිං පියාද අසුන් ගන්නේ එතැනයි. බ්‍රහ්මා සිටින අතර ශිව් බාබාද සිටියි. බ්‍රහ්මා නොසිටියේ නම්, ශිව් බාබා කතා කරන්නේ කෙලෙසද? ඔබ ශිව් බාබාව, සිහිපත් කරමින් සිටියේ එහි උඩ ඉහළයි. ඔබ දැන් මෙතැන පියාත් සමඟ අසුන් ගෙන සිටින බව ඔය දරුවන්ට වැටහෙයි. පියා උඩ ඉහළ සිටිනවා නොවේ. ඔහුගේ ස්වරූපයට වන්දනාමාන කරන්නේ මෙහිය. මෙම කරුණු හොඳින් වටහා ගත යුතුයි. පරම පියා දැනුමේ සාගරය බව ඔබ දන්නවා. ඔහු දැනුම කතා කරන්නේ කොහෙදීද? එහි ඉහළ සිට ඔහු කතා කරයිද? ඔහු මෙහි පහළට පැමිණ සිටියි. ඔහු එය කතා කරන්නේ බ්‍රහ්මාගේ ශරීරය තුළින්ය. සමහරුන්, බ්‍රහ්මා ගැන විශ්වාස නො කරන බව කියයි, එහෙත් ශිව් බාබාම, බ්‍රහ්මාගේ ශරීරය තුළින් පවසන්නේ, 'මා සිහිපත් කරන්න!' මෙය වටහා ගත යුතු දෙයකි. කෙසේවෙතත්, මායා ඉතා බලසම්පන්නයි. ඇය ඔබගේ මුහුණ මුළුමනින්ම හරවා ඔබව පස්සටම දමයි. ශිව් බාබා දැන් ඔබව ඔහු ඉදිරියේ තබා ඇත. ඔබ පෞද්ගලිකවම ඔහු ඉදිරියේ අසුන් ගෙන සිටියි. එබැවින් බ්‍රහ්මා කිසිවකු නොවේ යැයි විශ්වාස කරන අයට කුමන තත්ත්වයක් හිමි වෙයිද? ඔවුන් පහත් තත්ත්වයකට ඇද වැටෙයි. ඔවුන්ට කිසිම දැනුමක් නොමැත. මිනිසුන් අඬ ගසයි අහෝ දෙවි පියාණෙනි! එම දෙවි පියාණන්ට ඔවුන් ගේ හඬ ඇසෙයිද? විමුක්තිය ලබා දෙන්නා, පැමිණෙන්න! යැයි මිනිසුන් ඔහුට කියයි. ඔහු එතැන ඉහළ අසුන් ගෙන සිටියදී ඔවුන්ට විමුක්තිය ලබා දෙයිද? පරමාත්ම පියා සෑම චක්‍රයකදීම ඉතාමත්ම ශ්‍රේෂ්ඨ සංගම් යුගයෙදි පැමිණෙයි. ඔබ ඔහු පැමිණෙන කෙනාව පැත්තකට දමන්නේ නම්, එයට කුමක් යැයි කියන්නද? අංක එකේ තමෝප්‍රධාන්! ඔවුන්ට විශ්වාසය තිබුණත්, මායා මුළුමනින්ම ඔවුන්ගේ මුහුණ ඉවතට හරවයි. ඇයට කෙතරම් බලය තිබේද යත්, ඇය ඔවුන්ව මුළුමනින්ම සතයක්වත් නොවටින අය බවට පත් කරවයි. සමහර මධ්‍යස්ථාන වල එවැනි අය සිටින නිසයි පියා ඔබට ඉතා අවධානයෙන් සිටින ලෙස පවසන්නේ. ඔබට ඇසෙන දේ ඔබ නොකඩවා කීවත් එය පණ්ඩිතයාගේ නිදසුන මෙනි. බාබා කියන, පණ්ඩිතයාගේ කතාව තිබේ. රාමාගේ නම ජප කිරීමෙන්, ගඟ තරණය කළ හැකි බව ඔහු අන් අයට කීවේය. මෙය ගොතපු කතාවකි. මෙම කාලයේදී ඔබ පරම පියාගේ සිහිපත් කිරීම තුළින් විෂ සාගරයේ සිට කිරි සයුරට යමින් සිටියි. භක්ති මාර්ගයේ ඔවුන් බොහෝ ආගමික කතා ගොතා ඇත. එවැනි දේවල් සිදුවන්නේ නැත. එය නිකම්ම ගොතපු කතාවකි. එම පණ්ඩිතයා වෙනින් අයට මෙය කරන්න යැයි කීවත් ඔහු එය කෙසේවත් කළේ නැත. කෙනෙක් නොකඩවා දුර්ගුණ වල යෙදෙන ගමන් අන් අයට දුර්ගුණ වලින් වලකින ලෙස කියන්නේ නම්, එය ඔවුන් මත කුමන බලපෑමක් ඇති කරයිද? තමන් තුළ විස්වාසය නොමැති, එහෙත් අන් අයට මෙම ඥානය පවසන සමහර බ්‍රහ්ම කුමර කුමරියන් සිටිති. ඒ නිසයි, මෙම ඥානයට සවන් දෙන අයට, මෙම ඥානය කියා දෙන අයට වඩා වේගයෙන් ඉදිරියට යා හැකි යැයි කියන්නේ. බොහෝ දෙනෙකුට සේවය කරන අය අනිවාර්යෙන්ම ආදරයට පාත්‍ර වෙයි. පණ්ඩිතයා අසත්‍ය කෙනෙක් නම්, ඔහුට කවුරු ආදරය කරයිද? ප්‍රායෝගිකව සිහිපත් කිරීමේ යෙදෙන අයට ඔවුන්ගේ ආදරය මාරු වෙයි. මායා ඉතා හොඳ මහාරතීන්ව වුවද ගිල දමයි. බොහෝ දෙනෙක්ව ගිල දමා ඇත. බාබා විස්තර කරයි ඔබ තවමත් ඔබගේ කර්මතීට් තත්ත්වයට පත් වී නැත. එක අතකින් යුද්ධය ආරම්භ වන අතර, අනිත් අතින් ඔබ ඔබගේ කර්මතීට් තත්ත්වයට පත් වෙයි. ඒ දෙක මුළුමනින්ම සම්බන්ධයි. ඉන්පසු යුද්ධය අවසන් වූ පසු ඔබව මාරු

කරනු ලැබෙයි. පළමුව නිර්මාණය කරන්නේ රුද්‍රාගේ මාලාවයි. මෙම දේවල් ගැන වෙන කිසිවෙකු නොදනී. විනාශය අත ලඟ බව ඔබට වැටහෙයි. ඔබ දැන් අඩු සංඛ්‍යාවක් වන අතර, අන් අය වැඩි සංඛ්‍යාවක් බැවින්, කවුරු ඔබව විශ්වාස කරයිද? ඔබගේ සංඛ්‍යාවන් වැඩි වන විට, ඔබගේ යෝගා බලයෙන් බොහෝ දෙනෙක් මෙහෙට ඇදෙයි. ඔබ තුළ ඇති මළකඩ ඉවත් වන තරමට, ඔබ වැඩියෙන් බලයෙන් පිරෙයි. බාබා සෑම දෙයක්ම දන්න කෙනා (ජනීජනන්හර්) නොවේ. ඔහු මෙහි පැමිණ, සෑම කෙනා දෙසම බලා ඔවුන්ගේ තත්ත්වය දැන ගනියි. පියෙක් ඔහුගේ දරුවන්ගේ තත්ත්වය නොදැන සිටියිද? ඔහු ඒ ගැන සෑම දෙයක්ම දනී. ඒ පිළිබඳව අන්තර්යාමී වීම ගැන ගැටළුවක් නැත. ඔබ තවමත් ඔබගේ කර්මතීට් තත්ත්වයට පත් වී නොමැත. කතා කිරීමේදී සහ හැසිරීමේදී රාක්ෂක ක්‍රමයන් ඉතා ප්‍රසිද්ධයි. ඔබ ඔබගේ හැසිරීම දිව්‍යමය බවට පත් කළ යුතුයි. දේවතාවන් සෑම ගුණාංගයකින්ම පිරිපුන්ය. ඔබ දැන් ඔවුන් මෙන් විය යුතුයි. රාක්ෂයින් සහ දේවතාවන් අතර ඇති වෙනස විශාලය! කෙසේවෙතත්, මායා කිසි කෙනෙක් අත්හරින්නේ නැත ඇය ඔවුන්ව ‘නිදි-කුම්බා’ පැළයක් ලෙසට පත් කරවයි. ඇය සමහරෙක්ව මුළුමනින්ම මරා දමයි. පියවර (මහල්) පහක් ඇත. ශරීර අවධානය ඇති විට ඔබ පහතටම වැටෙයි. ඔබ වැටෙන විට මිය යයි. මේ දිනවල මිනිසුන් සිය දිවි නසා ගැනීමට විවිධ ක්‍රම සොයා ගනී. ඔවුන් මුළුමනින්ම අවසන් වන අන්දමට 21 වන මහලේ සිට පනී. ඔවුන් රෝහල් ගත වී දිගින් දිගටම වේදනා විඳින්නට අකමැතියි. කෙනෙක් 5 වන මහලෙන් වැටී මිය ගියේ නැතිනම්, ඔහු දිගින් දිගටම බොහෝ වේදනා විඳීයි. සමහරු තමන්ටම ගිණි තබා ගනී. එම පුද්ගලයා යම් කෙනෙක් විසින් බේරා ගත්තේ නම් ඔහුට බොහෝ වේදනා ඉවසා ගැනීමට සිදුවේ. ඔහු මුළුමනින්ම පිළිස්සී ගියේ නම් ඔහු ගේ ජීවය පිටතට දිව යයි. මේ නිසයි ඔවුන් සිය දිවි නසා ගෙන මුළුමනින්ම ශරීරය විනාශ කරගන්නේ. තම ශරීර අත්හැරීමෙන් දුකින් නිදහස් විය හැකි බව ඔවුන් විශ්වාස කරති. කෙසේවෙතත්, එය විශාල පාප කර්මයකි. ඔවුන්ට ඊටත් වඩා දුක් විඳින්නට සිදුවෙයි මන්ද, මෙය අනන්ත දුක ඇති ලෝකය නිසා. එහි අසීමිත සතුට තිබේ. ඔබ දැන් දුක් දේශයේ සිට සතුටු දේශයට ආපසු යන බව ඔය දරුවන්ට වැටහෙයි. ඔබව සතුටු දේශයේ අධිපතියන් බවට පත් කරවන පියාව ඔබ දැන් සිහිපත් කළ යුතුයි. පියා මෙම කෙනා තුළින් විස්තර කරන අතර ඔහුගේ පිළිරුවද තිබේ. බ්‍රහ්මාගේ මාර්ගයෙන් රාජයෝගා ස්ථාපනය කිරීම යැයි කියැවේ. ඔබ කියන්නේ බාබා, අප අපගේ දෙව්ලොව උරුමය ඔබගෙන් හිමි කර ගැනීමට බොහෝ වාර ගණනක් පැමිණ ඇත. ලෝකය වෙනස් විය යුතු වන විට, පරමාත්ම පියා පැමිණෙන්නේ සංගම් යුගයේදී පමණයි. පියා පවසන්නේ මම ඔය දරුවන්ව දුකින් මුදවා පාරිශුද්ධ වූ සතුටු දේශයට රැගෙන යාමට පැමිණියෙමි. ඔබ අඬ ගැසුවේ අහෝ පාරිශුද්ධත්වයට පමුණුවන්නා! මෙම කිලිටි වූ ලෝකයෙන් ඔබව ආපසු නිවහනට රැගෙන යන්නට කියා ඔබ මහා මරණයටයි අඬ ගැසුවේ කියා, ඔබට වැටහුනේ නැත. බාබා අනිවාර්යෙන්ම පැමිණෙයි. අප සියල්ලම මරණයට පත් වුණු විට පමණයි සාමය ඇති වන්නේ. මිනිසුන් නොකඩවා සාමය ගැන කතා කරයි. සාමය ඇත්තේ උත්තරීතර දේශයේය. කෙසේවෙතත්, තවමත් මෙම ලෝකයේ මිනිසුන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින්, මෙහි සාමය තිබෙන්නේ කෙසේද? ස්වර්ණමය යුගයේ සාමය සහ සතුට තිබිණ. දැන්, කලි යුගයේ, බොහෝ ආගම් තිබේ. ඒ සෑම එකක්ම විනාශ වූ විට, ඉන්පසු එක් ධර්මයේ ස්ථාපනය සිදුවේ. එවිට පමණයි සාමය සහ සතුට ඇති වන්නේ. දුක් පීඩාවන්ගේ හඬට පසුවයි ජයග්‍රහණයේ හඬ ඇති වන්නේ. ඔබ තව දියුණුවත්ම, මරණයේ වෙළඳපොල කෙතරම් උණුසුම් වන්නේද කියා ඔබ දකීවි! විනාශය අනිවාර්යෙන්ම සිදුවිය යුතුයි. පියා පැමිණ, එක් ධර්මයේ ස්ථාපනය දිරි ගන්වන අතර ඔහු රාජ යෝගාද උගන්වයි. අනේක විවිධ ආගම් අවසානයට පත්වෙයි. ගීතාවේ කිසි දෙයක් සඳහන් කර නොමැත. ඔවුන් කියන්නේ පාණ්ඩවයන් පස් දෙනා සහ ඔවුන්ගේ බල්ලා, හිමාල අඩවියේ දිය වුණු බව කියායි. එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද? ඔවුන් සමූලඝාතනය පෙන්වා ඇත. ගංවතුරක් ඇති වෙයි එහෙත් මුළු ලොවම යට විය නොහැක. භාරතය අවිනාශී පාරිශුද්ධ භූමියයි. එයිනුත්, ඔය දරුවන්ගේ මාර්ගයෙන් සෑම දෙනාටම විමුක්තිය ලබා දීමට පරම පියා පැමිණෙන, අබූ, පූජනීයම වන්දනා ස්ථානයයි. දිල්වාලා දේවාලය බොහෝ වැදගත් කමක් ඇති ඉතා හොඳ සිහිවටනයකි! කෙසේවෙතත්, එය ගොඩ නැගූ අයට මෙය වැටහුණේ නැත, එහෙත් අඩු තරමින් ඔවුන් නුවණැත්තන් විය! තඹ යුගයේදී ඔවුන් අනිවාර්යෙන්ම තවමත් නුවණැත්තන්ව සිටියේය. කලි යුගයේදී ඔවුන් තමෝප්‍රධාන්ය. තඹ යුගයේදී ඔවුන්ට අඩු කරමින් තමෝ බුද්ධීන් තිබිණ! ඔබ අසුන් ගෙන සිටින දේවාලය ශ්‍රේෂ්ඨතම දේවාලයයි. ඔබ සජීවී ස්වරූපයෙන් සිටින බවත්, ඒවා අජීවී ස්වරූප බවත් ඔබට වැටහෙයි. එය අපගේ සිහිවටනයයි. කෙසේවෙතත්, අපි ‘සජීවී දිල්වාලා දේවාලය’ යැයි නොලිවිය යුතුයි. ජයිනවුන් විරුද්ධ වී මෙසේ අසයි ‘ඔවුන් සිතන්නේ ඔවුන් කවුරු කියාද?’ විනාශය වන අතරෙදි තොග ගණනින් මරණය සිදුවන අන්දම ඔබ දැන් නොකඩවා දකීවි. තොග ගණනේ මහා යුද්ධයක් තිබෙයි. සෑම දෙයක්ම විනාශ වෙයි. එක් දේශය පමණක් ඉතිරි වෙයි.

භාරතය ඉතා කුඩා වී, අන් සියල්ලම විනාශ වෙයි. දිව්‍යලෝකය ඉතා කුඩා වෙයි! මෙම ඥානය දැන් ඔබගේ බුද්ධිය තුළ ඇත. සමහර මිනිසුන්ට වටහා ගැනීමට බොහෝ කාලයක් ගත වෙයි. මෙය වඩාත්ම ශ්‍රේෂ්ඨ වූ සංගම් යුගයයි. මෙහි බොහෝ මනුෂ්‍ය සංඛ්‍යාවක් සිටින නමුත්, එහි ඉතා ස්වල්ප දෙනෙක් සිටියි! සෑම දෙයක්ම විනාශයට පත් වෙයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නැවතත් මුල සිට සිදු වෙයි. එය අනිවාර්යෙන්ම නැවත සිදුවන්නේ දිව්‍යලෝකයේ ආරම්භයේ සිටයි. එය අවසානයෙන් ආරම්භ වන්නේ නැත. ලෝක නාටක චක්‍රය සදාකාලිකයි, එය නොකඩවා භ්‍රමණය වෙයි. මේ පැත්තේ කලි යුගය ඇති අතර, එහා පැත්තේ ඇත්තේ ස්වර්ණමය යුගයයි. අප දැන් සිටින්නේ සංගම් යුගයේය. ඔබට පමණයි මෙය වැටහෙන්නේ. පරමාත්ම පියා පැමිණිය යුතුයි. එබැවින් ඔහුට අනිවාර්යෙන්ම රථයක් අවශ්‍යයි. ඔබ දැන් නිවහනට යන බව පියා විස්තර කරයි. ඉන්පසු ඔබ ලක්ෂ්මි සහ නාරායන විය යුතුයි. එබැවින් ඔබ දිව්‍යමය ගුණාංගද ධාරණය කළ යුතුයි. මායා කෙසේද යත් ඇයට ඔබව වැසිකිළි ශෝදකයෙක් බවට පත් කළ හැක! මේ නිසයි සමහරු ලියන්නේ බාබා මම මගේ මුහුණ කිලිටි කර ගත්තේය. රාවණ්ගේ රාජධානිය කුමක්ද සහ රාමාගේ රාජධානිය කුමක්ද කියා, ඔය දරුවන්ට කියා ඇත. පියා මෙතැන අසුන්ගෙන, ඔබ අපවිත්‍රව සිට පාරිශුද්ධ වන අන්දමත්, පාරිශුද්ධත්වයෙන්, අපවිත්‍රභාවයට පත්වන අන්දමත් ගැන නාටකයේ මෙම රහස් විස්තර කර දෙයි. පරම පියා ඥානයෙන් පිරිපුන් කෙනා සහ බීජයයි. ඔහු සජීවී ජීවයයි. පැමිණ ඔබට විස්තර කරන්නේ ඔහු පමණයි. පියා පමණයි ඔබගෙන් විමසන්නේ මුළු කල්ප වෘක්ෂයේම රහස් ඔබ වටහා ගත්තාද? මෙහි සිදුවන්නේ කුමක්ද? ඔබ කොතරම් කාලයක් එහි කොටසක් රඟපානවාද? චක්‍රයෙන් භාගයක් එය දේවතා රාජ්‍යයයි. චක්‍රයේ ඉතිරි භාගයේදී එය රාක්ෂක රාජධානියයි. හොඳ දරුවන්ගේ බුද්ධියේ මෙම ඥානය රඳා පවතියි. පියා ඔබව ඔහු හා සමාන තත්ත්වයකට පත් කරවයි. ගුරුවරුන්ද අංකානුසාරයි. සමහර ගුරුවරුන් කනස්සලුභාවයට පත් වෙති. ඔවුන් බොහෝ දෙනෙකුට උගන්වා, ඉන්පසු ඔවුන්ම අතුරුදහන් වෙයි. තරුණ දරුවන් අතරේ බොහෝ විවිධ සංස්කාර ඇති සමහරුන් සිටිති. සමහරුන් අංක එකේ රාක්ෂයින් වන අතර සමහරුන් සුරදූතිකාවන්ගේ දේශයට යාමට වටිනා අයයි. සමහරුන් ඥානය ලබා ගන්නේවත්, තමන්ගේ චරිතය නිදොස් කරගන්නේවත් නැති අතර, දිගටම අන් අයට දුක් ගෙන දෙයි. රාක්ෂයින් රහසේ විත් ඔවුන් අතරේ අසුන් ගන්නා අයුරු ග්‍රන්ථ වල නිරූපනය කර ඇත. රාක්ෂයින් වශයෙන් ඔවුන් බොහෝ අපහසුතා ඇති කරයි! ඒ සියලු දේවල් දිගටම සිදුවෙයි. දිව්‍යලෝකය ස්ථාපනය කිරීමට උසස්ම-උසස් පියා පැමිණිය යුතුයි. මායාද බොහෝ බලවත්ය. ඔබ සෑම දෙයක්ම පරිත්‍යාග කළාට පසුවත්, මායා ඔබගේ බුද්ධිය ඉවතට හරවයි. මායා අනිවාර්යෙන්ම ඔය දරුවන්ගෙන් භාගයක්ම ගිල දමයි. මේ නිසයි මායා ඉතා බලසම්පන්නයි කියා කියන්නේ. චක්‍රයෙන් භාගයක්ම මායා පාලනය කරමින් සිටි බැවින් ඇය අනිවාර්යෙන්ම බලසම්පන්නයි. මායාගෙන් පරාජය ලබන අයගේ තත්ත්වය කුමක් වෙයිද? අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිවිටෙක 'නිදිකුම්බා' පැළයක් මෙන් නොවන්න. දිව්‍යමය ගුණාංග ධාරණය කරගෙන තම චරිතය පරිවර්ථනය කරගන්න.
2. පියාගේ සෙනෙහස ලබා ගැනීමට නම්, සේවය කරන්න, එහෙත් ඔබ අන් අයට ධාරණය කිරීමට යැයි කියනා දේවල්, ඔබත් ධාරණය කරන්න. ඔබගේ කර්මතීත් තත්ත්වයට පත් වීමට සම්පූර්ණ උත්සාහ දරන්න.

**වරදානය:** ඔබට ඒකාබද්ධ ස්වරූපයක් ලැබී බාප්දාදා පෞද්ගලිකව ශාරීරික ස්වරූපයෙන් ඔබ ඉදිරියේ සිටින බව අත්විඳින්නට ලැබේවා.

ශිව සහ ශක්ති ඒකාබද්ධ වී ඇති ආකාරයටම, පාණ්ඩවයන්ගේ පියා සහ පාණ්ඩවයන් ඒකාබද්ධ වී ඇත. ඒකාබද්ධ ස්වරූපයෙන් සිටින අයට, බාප්දාදා සියලු සබඳතා වලදී ශාරීරික ස්වරූපයෙන් ඔවුන් ඉදිරිපිට සිටී. දැන්, දිනෙන් දින, බාප්දාදා ඔබ ඉදිරියට පැමිණ ඔබේ අත අල්ලාගෙන සිටින බව ඔබට අත්විඳිය හැකිය. ඔබ ඔහුව ඔබේ බුද්ධියෙන් නොව ඔබේ ඇස්වලින් දකිනු ඇත. ඔබ ඔහුව අත්විඳිනු ඇත, ඔබ කළ යුත්තේ "එකම එක පියාට මිස අන්

කිසිවෙකුට අයත් නොවේ" පාඩම ස්ථිර කර ගැනීමයි. එවිට, ඔබේ සෙවනැල්ල සැමවිටම ඔබ වටා ඇති ආකාරයටම, ඒ ආකාරයෙන්ම, බාප්දාදා ඔබේ ඇස් වලින් ඉවත් නොවනු ඇත. ඔබ නිරන්තරයෙන් ඔහු ඔබ ඉදිරියේ සිටින බව අත්විඳිනු ඇත.

**පාඨය:** මායා සහ පදාර්ථය ජයගත් උසස් ජීවාත්ම තමන්ටම සහ ලෝකයට ද යහපත සලසයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ඔබ දැන් ජීවන මුක්තිය ලැබූ විට, ඔබේ ජීවන මුක්ති අවධියේ බලපෑම ජීවිතයේ බන්ධන වල සිටින ජීවාත්මයන්ගේ බන්ධන අවසන් කරනු ඇත. ඉතින්, ඔබ සියල්ලන්ම ජීවන මුක්තිය ලබන සහ කිසිදු බන්ධනයක් නොමැති දිනය කවදා පැමිණේවිද? සියලු බන්ධන අතරින්, පළමු බන්ධනය ශරීර අවධානයේ බන්ධනයයි. එයින් නිදහස් වන්න. ශරීරයක් නොමැති විට, අනෙකුත් සියලුම බන්ධන ඉබේටම අවසන් වේ.